**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2025**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ("ආයතනය") 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 2017 අංක 05 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 19 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ආයතනයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාල විගණන සාක්ෂි ලබාගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- ආයතනය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- ආයතනය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.5.1 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයිති පරිශ්‍රයක පවත්වාගෙන යන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන ගොඩනැගිල්ලේ 2022-2024 කාලය තුළ විදුලි පරිභෝජනය වෙනුවෙන් රු.6,698,048ක වියදම් වෙන්කර ඇතත් වර්ෂය අවසන් වන විටත් එකී ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි . | ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් මෙම මුදල පොත්වලින් ලියා හැරීමට අවසර ඉල්ලා සිටින ලද අතර ලියාහැරීම කළ නොහැකි බවත් සහ අදාළ මුදල ගෙවීම සම්බන්ධයෙන් තවදුරටත් කළමණාකරණ කමිටුව සමග සාකච්ඡා කොට සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කරන බව | තීරණයකට එළැඹ අදාල ගෙවීම් නොපමාව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,023,595ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,836,589ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,860,184ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආයතනයේ මෙහෙයුම් වියදම් රු.5,275,068කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

| අයිතමය | සමාලෝචිත වර්ෂය | ඉකුත් වර්ෂය | ඉකුත් වර්ෂය සමඟ වැඩිවීම/ (අඩුවීම) | වෙනස්වීමේ ප්‍රතිශතය |
| --- | --- | --- | --- | --- |
| | රු. | රු. | රු. | සියයට |
| රජයේ ප්‍රදාන | 24,304,000 | 24,465,000 | (161,000) | 0.66 |
| වෙනත් ආදායම් | 1,545,514 | 1,346,789 | 198,725 | 14.75 |
| පාඨමාලා ආදායම් | 5,959,333 | 5,636,667 | 322,666 | 5.72 |

| | | | | |
|---|---|---|---|---|
| වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ | 27,170,504 | 22,429,192 | 4,741,312 | 21.13 |
| සැපයුම් හා පරිභෝජන වියදම් | 724,638 | 340,938 | 383,700 | 112.54 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 2,393,936 | 1,640,223 | 753,713 | 45.95 |
| වෙනත් වියදම් | 3,641,485 | 2,733,548 | 907,937 | 33.21 |

**2.3 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 1.16:1ක් හා 1.13:1ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එම අගයන් පිළිවෙලින් 1.39:1ක් හා 1.37:1ක් විය. ඒ අනුව ද්‍රවශීලතාවය පෙර වර්ෂයට සාපේක්ෂව අඩුවීමක් දක්නට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය තුළ ඇතුලත් වී තිබුණු සිසුන් 12ක් ද ඇතුළත්ව 2025 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි අධ්‍යාපනය ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 52ක් වූ බැවින් ප්‍රධාන පාඨමාලා සඳහා ශිෂ්‍ය ආකර්ශණය අඩුවීමක් නිරීක්ෂණය විය. තවද පශ්චාත් උපාධි ආයතනය ආරම්භයේ සිට ගත වූ වසර 07 සඳහා ආයතනය වෙත රු.128,723,000ක රජයේ පුනරාවර්තන ප්‍රදාන ලබා දී තිබුණු අතර එම කාලය තුළ උත්පාදිත ආදායම රු.29,598,067ක් පමණක් වී තිබුණි. ආයතනයේ අරමුණු ඉටුවන අයුරින් සහ ස්වාධීනව පවත්වා ගෙන යා හැකි ආකාරයෙන් දිගුකාලීන මධ්‍යකාලීන හා කෙටිකාලීන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියාමන තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත ශිෂ්‍ය බඳවා ගැනීම් මට්ටම ලඟා කර ගැනීමට නොහැකි වූ අතර එය ස්වයං උත්පාදිත ආදායම් ප්‍රමාණයට සෘජුව බලපා ඇති බව හා නව පාඨමාලා හඳුන්වා දීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමෙන් ස්වයං උත්පාදිත ආදායම් වැඩි දියුණු කර භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ඇති යැපීම ක්‍රමයෙන් අඩුකිරීමට අපේක්ෂා කරනු ලබන බව. | ආයතනය පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් අධ්‍යයනයක් සිදුකර ශිෂ්‍ය ලියාපදිංචිය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 උපායමාර්ගික සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 පරිච්ඡේදය හා ඇමුණුම I අනුව, | | |

| | | | |
|---|---|---|---|
| (අ) | උපායමාර්ගික සැලැස්ම සෑම වසරකම යාවත්කාලීන කර ඊළඟ වසර ආරම්භ වීමට දින 15කට පෙර මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021-2025 සඳහා සකස්කර තිබුණු උපායමාර්ගික සැලැස්ම එලෙස යාවත්කාලීන කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත පරිදි මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | සෑම වසරකම යාවත්කාලීන කරන ලද උපායමර්ගික සැලැස්ම ඊළඟ වසර ආරම්භ වීමට දින 15කට පෙර මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ආයතනයේ වත්මන් තත්වය සහ එය තිබිය යුතු ස්ථානය අතර වෙනස්කම් හඳුනා ගැනීම සඳහා නියමිත අරමුණු වලට අනුකූලව පරතර විශ්ලේෂණයක් සිදුකළ යුතු බවත් හඳුනාගත් පරතරයන් සුදුසු උපායමාර්ග සමග ආමන්ත්‍රණය කර තිබිය යුතු වුවත් එවැනි පරතර විශ්ලේෂණයක් සිදුකර නොතිබුණි. | ආයතනයේ මූලික කාර්යයන් සීමිත සේවක සංඛ්‍යාවක් මගින් ඉටුකිරීමට සිදුවූ බවත් අවශ්‍ය ලේඛන නියමිත පරිදි සකස් කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකරන බව. | උපායමාර්ගික සැලැස්මට පරතර විශ්ලේෂණයක් ඇතුලත් කළ යුතුය. |
| (ඇ) | උපායමාර්ගික සැලැස්ම යටතේ ආවරණය වන කාලසීමාව සඳහා සාරාංශගත පුරෝකථනය කරන ලද මූල්‍ය ප්‍රකාශන උපායමාර්ගික සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | ආයතනයේ මූලික කාර්යයන් සීමිත සේවක සංඛ්‍යාවක් මගින් ඉටුකිරීමට සිදුවූ බවත් අවශ්‍ය ලේඛන නියමිත පරිදි සකස් කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකරන බව. | සාරාංශගත පුරෝකථනය කරන ලද මූල්‍ය ප්‍රකාශන උපායමාර්ගික සැලැස්මට ඇතුලත් කළ යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපායමාර්ගික සැලැස්ම මගින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත උපායමාර්ග 04කට අදාල ක්‍රියාකාරකම් 18ක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | විමසුමේ සඳහන් ඇතැම් ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් නොමැතිවීම හේතුවෙන් ඇතැම් ක්‍රියාකාරකම් අත්හළ බවත් ඇතැම් ක්‍රියාකාරකම් ඉදිරියේදී සිදු කිරීමට බලාපොරොත්තුවන බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී උපායමාර්ගික සැලැස්මට අනුකූලව සකස් කල යුතුය. |